අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாய'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..................

මගේ අංකය / எமது இல. / My No. ED/01/21/01/32

දිනය / திகதி / Date: 2017/09/29

චක්‍රලේඛ අංක - **35/2017**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපතිවරුන්,
සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලු ම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,
සියලු ම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලු ම ජාත්‍යන්තර පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය - 2017

"සදා සුරකිමු - දැයේ දරුවන්" තේමාව තුළ ක්‍රියාත්මක කෙරෙන "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය දරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට 2017 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවක් මත රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනකි.

දැනුමින් හා කුසලතාවලින් පරිපූර්ණ වූ දරුවන් සමාජගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මුඛ්‍ය පරමාර්ථය වන අතර ඒ සඳහා සෞඛ්‍ය සම්පන්න ආරක්ෂිත පරිසරයක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් සිසුන්ගේ කායික හා මනෝ සමාජයීය යහපැවැත්ම තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ඇති අතර පාසල තුළ දී හා ඉන් පිටත දී ඇතිවන රෝග, අනතුරු හා ආබාධ සඳහා රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා දීම තුළින් සෞඛ්‍ය හා අධ්‍යාපනය තහවුරු කිරීමේ පියවරක් ලෙස සිසු රක්ෂණාවරණය හඳුන්වා දීමට ක්‍රියා කෙරේ.

රෝග, අනතුරු හා ආබාධ තත්ත්වවල දී ඉක්මන් සෞඛ්‍ය සේවා සඳහා යොමු කරමින් පාසල් පැමිණීම වැඩි කිරීම, ආබාධ තත්ත්වවල දී අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීමට සහාය වීම යන අරමුණු මත "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය හඳුන්වා දෙනු ලබන අතර එමගින් සියලු ම ශ්‍රී ලාංකික පාසල් සිසුන් ආවරණය කෙරේ. එනම් සියලු ම රජයේ පාසල්, රජයේ අනුමත ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, උපකෘත විශේෂ පාසල් සහ ජාත්‍යන්තර පාසල් යන විධිමත් සාමාන්‍ය අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී අධ්‍යාපන කාර්යයේ නිරතවන 1 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල දී විශේෂ අධ්‍යාපන ඒකකවල ද ඉගෙනුම ලබන වයස අවුරුදු 5ත් 19ත් අතර වයස් සීමාවේ පසු වන සියලු ම සිසුහු මෙම රක්ෂණාවරණයේ ප්‍රතිලාභීහු වෙති.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂිකව ගිවිසුම්ගත වන රක්ෂණ ආයතනය මගින් ගිවිසුම්ගතව සක්‍රිය වන දිනයේ සිට වර්ෂයක කාලයක් සඳහා රක්ෂණාවරණය සැපයේ. ඒ අනුව 2017 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය සමග ගිවිසුම්ගත "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව" විසින් 2017 ඔක්තෝබර් 01 දින සිට 2018 සැප්තැම්බර් 30 දින දක්වා වන වර්ෂයේ දවසේ පැය 24 ම ආවරණය වන පරිදි දින 365ක කාලයක් සඳහා රක්ෂණාවරණය සැපයේ.

රක්ෂණාවරණ පහසුකම් අංශ තුනකින් සමන්විත වේ. ඒවා 1, 2, සහ 3 ලෙස දැක්වේ.

**සෞඛ්‍ය රක්ෂණාවරණය**

වාර්ෂික ව නේවාසික ප්‍රතිකාර සඳහා රු 200,000ක ප්‍රතිලාභයක් ද, හඳුනාගත් බාහිර රෝග 7 ක් වෙනුවෙන් බාහිර ප්‍රතිකාර සඳහා රු 10,000ක රක්ෂණ ප්‍රතිලාභයක් ද සෑම ශිෂ්‍යයකු සඳහා ම සැපයෙන අතර එය පහත සඳහන් ප්‍රතිලාභවලින් සමන්විත වේ.

**නේවාසික රෝගීන්ට සහ වෛද්‍ය සේවා සැපයීමට අයත් ප්‍රතිලාභ**

රජයේ නීති රෙගුලාසි අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති රෝහලක හෝ ආරෝග්‍ය ශාලාවක නේවාසිකව ප්‍රතිකාර ලබන අය සඳහා මෙම ප්‍රතිලාභය හිමි වේ.

| | | |
|---|---|---|
| **1.1 A. නේවාසික රෝගීන්ට සහ වෛද්‍ය සේවා සැපයීමට අයත් ප්‍රතිලාභ**<br>**- පුද්ගලික රෝහලක, රජයේ රෝහලක ගෙවන වාට්ටුවක (ආයුර්වේද ප්‍රතිකාර ද ඇතුළු ව)** | | |
| එක් අයකු සඳහා වාර්ෂික රක්ෂණාවරණය<br>(එක් රෝහල්ගත වීමක් සඳහා උපරිමය රුපියල් 100,000/-) | | **රු.200,000/-** |
| | ආරෝග්‍ය ශාලාවක කාමරයක්/ශාලාවක් සඳහා උපරිමය<br>*කාමර ගාස්තු දිනකට උපරිමය - රු. 5,000/-*<br>*එක් රෝහල් ගතවීමකට උපරිම - රු.30,000/-* | වර්ෂයකට උපරිම රු.60,000/- |
| ii. | ශල්‍ය වෛද්‍යවරයකු, නිර්වින්දන වෛද්‍යවරයකු, MBBS හෝ DAMS හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත වෛද්‍යවරයකු, වෛද්‍ය උපදේශකවරයකු, විශේෂඥ වෛද්‍යවරයකු සඳහා එක් රෝහල්ගත වීමක් සඳහා උපරිම රු.30,000/- | වර්ෂයකට උපරිම රු.60,000/- |
| iii. | විවිධ ආරෝග්‍යශාලා සේවා සහ සැපයීම් එක් රෝහල්ගත වීමක් සඳහා උපරිමය රු. 40,000/-<br>(ඖෂධ සහ බෙහෙත්, සැත්කම් ගාස්තු, පරීක්ෂණ, විශේෂ ප්‍රතිකාර) | වර්ෂයකට උපරිම රු.80,000/- |
| **1.1B. නේවාසික රෝගී ප්‍රතිලාභ**<br>**- රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක (ආයුර්වේද ප්‍රතිකාර ඇතුළුව)** | | |
| i | දෛනික ගාස්තු (වර්ෂයකට උපරිම දින 30ක් දක්වා)<br>***එක් දිනක් යනු පැය 24ක කාල සීමාවකි.*** | රු.1,000/- |
| ii. | රෝහලින් සැපයිය නොහැකි ඖෂධ හා බෙහෙත්, පරීක්ෂණ, ස්කෑන්, එක්ස්රේ පිටතින් සිදු කිරීම සඳහා එක් අවස්ථාවකට හෝ වර්ෂයකට | රු. 10,000/- |

| **1.1A හා 1.1B සඳහා අතිරේක පහසුකම්** | | |
|---|---|---|
| a | නේවාසික රෝගීන් සඳහා පසු රෝහල් සේවා යටතේ රෝහල්ගත කාලයෙන් පසුව ඉදිරි සතියක කාලයක් සඳහා වන ඖෂධ හා බෙහෙත් සඳහා යන වියදම ආවරණය කෙරේ. (රෝහලෙන් පිටවන අවස්ථාවේ දී වෛද්‍යවරයා විසින් නිර්දේශ කරනු ලැබ තිබිය යුතු ය.) | |
| b. | 1.1A හි iii අදාළව රෝහල් ගතවීමකින් තොරව වුව ද පහත පරීක්ෂණ සඳහා වියදම් ප්‍රතිපූරණය කෙරේ.<br>1. EEG 2. MRI 3. CT scan 4. DMSA scan 5. DTPA scan 6. Ultra Sound scan and 7. NIS Dengue Antigen test 8. Endoscopy 9. Colonoscopy 10. Bronchoscopy 11. Sigmoidoscopy | |
| c. | ඉහත b. හි අඩංගු 1සිට 11දක්වා පරීක්ෂණවලට අදාළව වෛද්‍ය ගාස්තු එක් අවස්ථාවක් සඳහා උපරිම ගාස්තු | රු. 7,500/- |
| d. | රෝහල්ගතවීමකින් තොරව එක්දින ශල්‍යකර්ම සිදු කරන විට ඉහත ii හා iii උප සීමාවන්ට යටත්ව ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව හිමි වේ. | |

බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ

**බාහිර රෝග ප්‍රතිකාර යටතේ හඳුනාගත් රෝග සඳහා ඖෂධ වෛද්‍ය ගාස්තු හා පරීක්ෂණ වෙනුවෙන් ප්‍රතිලාභ හිමි වේ.**

| **බාහිර ප්‍රතිකාර ආවරණය වර්ෂයකට** | | රු. 10,000/- |
|---|---|---|
| | පහත සඳහන් හඳුනා ගනු ලැබූ ජීවිත අවදානමක් සහිත විශේෂ රෝග අවස්ථාවලට අදාළව ඖෂධ හා බෙහෙත් පරීක්ෂණ හා අනාවරණවලට අදාළ වියදම් ආවරණය<br>පිළිකා - cancer<br>අවසන් අදියරේ වකුගඩු අකර්මණ්‍යතාව - End state rental failure<br>ප්‍රධාන ඉන්ද්‍රිය බද්ධ කිරීම - Major organ transplantation<br>අංශභාගය - Paralysis<br>අන්ධභාවය - Blindness<br>බහුවිධ ජාරිධ්‍යය - Multiple-sclerosis<br>තුන්වන මට්ටමේ පිළිස්සීම - Third degree burns | |

| | **කොන්දේසි (මෙය 1.1 හා 1.2 ට අදාළ වේ)** |
|---|---|
| **1.** | සියලු ම වෛද්‍ය ගාස්තු හා සේවා සඳහා වන වියදම වෙළඳපොළේ පවතින මිල ගණන් අනුව ගණනය කිරීම. |
| **2.** | බිල්පත් ප්‍රතිපූරණය කිරීම පමණක් සිදු කෙරේ. |
| **3.** | වෛද්‍යවරයකු ලෙස MBBS හෝ DAMS හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත වෛද්‍යවරයකු පිළිගැනේ. |

**හදිසි අනතුරු ආවරණය**

හදිසි අනතුරු යනු අනපේක්ෂිත වූද, සාහසික වූද , දෘෂ්‍යමාන වූද , ආකාරයකින් රක්ෂිතයාගේ රක්ෂිත කාලසීමාව තුළ ශරීරයට සිදුවන තුවාල හෝ එම හේතු නිසා සිදුවන මරණ වේ.

## *2.1. අනතුරකින් මියයාම*

| | | |
|---|---|---|
| 2.1A | ශිෂ්‍යයා (දෙමාපියන්ට හෝ නීත්‍යානුකූල භාරකරුට) | රු. 100,000/- |
| 2.1B | මව/පියා (වසරක් තුළ එක් අයකු සඳහා පමණි.)<br>ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කළ හැක්කේ පවුලේ එක් සිසුවකු විසින් පමණක් වන අතර ප්‍රතිලාභය පවුලේ සියලු ම සිසු දරුවන් අතරේ සමව බෙදා ගිණුම්ගත කෙරේ. | රු. 75,000/- |
| ***2 .2. පූර්ණ හා සදාකාලික අකර්මණ්‍යතා ප්‍රතිලාභය - සිසුන් සඳහා පමණි.*** | | |
| 2.2A | පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා | රු. 100,000/- |
| 2.2 B | සදාකාලික අර්ධ අකර්මණ්‍යතා<br>ඇස් දෙකෙහිම පෙනීම අහිමි වීම<br>ගාත්‍ර දෙකක් අහිමි වීම<br>එක් ඇසක් හා එක් ගාත්‍රයක් අහිමිවීම<br>එක් ඇසක් හෝ එක් ගාත්‍රයක් අහිමි වීම | <br>රු. 100,000/-<br>රු. 100,000/-<br>රු. 100,000-<br>රු. 50,000/- |

මෙම ආවරණය සිසුවෙකු සඳහා වසරකට රුපියල් 100,000ක් හා දෙමාපියන් සඳහා වසරකට රු 75,000/-ක උපරිමයකට යටත් වේ.

**විශේෂ ප්‍රසාද දීමනා**

***නේවාසික රෝහල් ගාස්තුවලින් 20% ක් අඩුකිරීම***

නේවාසික ප්‍රතිකාර ගැනීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි සියලු ම පෞද්ගලික රෝහල් හා ආරෝග්‍යශාලා මගින් බිල්පතෙන් එනම් රෝහල් ගාස්තු, වෛද්‍ය ගාස්තු, පරීක්ෂණ ගාස්තු ද, ඖෂධ වියදම් හැර අනෙකුත් වියදම් ද ඇතුළත් ව වියදමෙන් 20%ක අඩු කිරීමක් විශේෂ ප්‍රතිලාභයක් ලෙස හිමිවේ. මෙය සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පෞද්ගලික සෞඛ්‍ය නියාමන සභාව, පෞද්ගලික රෝහල් සහ සාත්තු නිවාස සංගමය සහ විශේෂඥ වෛද්‍ය සංගම්වල එකඟතාව මත සිදු කරනු ලබන්නකි.

***වෛද්‍ය උපදේශකවරයකු හෝ විශේෂඥ වෛද්‍යවරයකුගේ ගාස්තුවලින් 20% ක් අඩු කිරීම***

පුද්ගලික රෝහලක හෝ ආරෝග්‍යශාලාවක පවතින සේවා ලබා ගැනීමක දී වෛද්‍ය උපදේශකවරයකු හෝ විශේෂඥ වෛද්‍යවරයකුගේ ගාස්තුවලින් 20%ක් අඩු කිරීමට විශේෂඥ වෛද්‍ය සංගම් එකඟතාව පළ කර ඇත.

ඉහත 3.0 හි 3.1 සහ 3.2 අවස්ථාවල ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා "සුරක්ෂා" සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභියකු බව තහවුරු කළ යුතු ය. ඒ සඳහා රක්ෂණ කාඩ්පත භාවිත කළ යුතු ය.

මෙම රක්ෂණාවරණ සීමා, කොන්දේසි, ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ස්ථාන, රක්ෂණාවරණ නොලබන අවස්ථා පිළිබඳ විස්තර මේ සමඟ ඇති උපදෙස් මාලාව තුළ අන්තර්ගත කෙරේ.

සිසුන්ට රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා දීමේ දී අධ්‍යාපන නිලධාරීන් ගෙන් සහ පාසල් ප්‍රධානීන් ගෙන් පහත සඳහන් කාර්ය ඉටු විය යුතු ය.

1. පළාත් අධ්‍යාපන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහභාගිත්වයෙන් කමිටුවක් පත් කිරීම හා අවශ්‍ය සොයා බැලීම් හා මැදිහත් වීම් සිදු කිරීම.
2. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද, අධ්‍යාපන කලාප කාර්යාලයේ ද, පාසලේ ද මෙම කාර්යය භාරව නිලධාරියකු/ගුරුභවතකු පත් කිරීම.
3. තම පාසලේ ඉගෙනුම ලබන සිසුන් පිළිබඳ තොරතුරු නිසි පරිදි සැපයීම.
4. රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමේ දී තොරතුරු සහතික කිරීම.
5. ප්‍රතිලාභ ලබාගන්නා වූ සිසුන් පිළිබඳ තොරතුරු ගොනුවක් (භෞතික හෝ පරිගණක ගත) පාසලේ පවත්වා ගැනීම හා අවශ්‍ය ආයතන වෙත තොරතුරු ලබා දීම.
6. පාසල් විසින් නව සිසුන් ඇතුළත් වීමේ දී එම තොරතුරු නො පමා ව අදාළ අංශ වෙත වාර්තා කිරීම.
7. පාසල් අධ්‍යාපනයෙන් සිසුන් ඉවත් වන ඕනෑ ම අවස්ථාවක දී එම සිසු තොරතුරු නොපමාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හෝ එහි ශාඛාවකට ලිඛිත ව දැනුම් දීම.
8. රක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ සියලු තොරතුරු අඛණ්ඩ ව සිසුන්, දෙමාපියන් සහ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.
9. ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ ගැටලු ඇති වන අවස්ථාවල දී මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.
10. සිසු රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා ගැනීමට අවකාශ සැලසීම.

එක් එක් අධ්‍යාපන ආයතන සතු කාර්යභාරය උපදෙස් මාලාව තුළ අන්තර්ගත කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් හඳුන්වා දෙනු ලබන "සුරක්ෂා"සිසු රක්ෂණාවරණයට අදාළ ප්‍රතිලාභ, කොන්දේසි හා අපේක්ෂිත කාර්යභාරය පිළිබඳ නිසි පරිදි ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතු ය.

නිරෝගී දරු පරපුරක් දැයට දායාද කිරීම හා ලැබී ඇති අධ්‍යාපනික අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩකඩ සැලසීම සඳහා සිසු රක්ෂණාවරණයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට හිමිකර දීම සඳහා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

මෙම චක්‍රලේඛය නිකුත්කරනු ලබන භාෂා අතර අර්ථයෙහි වෙනසක් පවතීනම් සිංහල භාෂාවෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයෙහි අර්ථය නිවරදි සේ සැලකිය යුතුයි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. විගණකාධිපති
04. ලේකම්, මුදල් අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය ව්‍යවසායසංවර්ධන අමාත්‍යාංශය
06. ලේකම්, සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
07. ලේකම්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය
08. සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්